# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 93/5 – 1974 ජනවාරි 10 වැනි බ්‍රහස්පතින්දා – 1974.01.10

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1972 අංක 05 දරන සමුපකාර සමිති පනත**

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ විදේශීය හා දේශීය වෙළඳ ඇමතිතුමා විසින් පනවනු ලැබ 1973 නොවැම්බර් මස 20 වැනි දින ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද රීති.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1973 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මේ රීතිවලට 1973 සමුපකාර සමිති රීති යයි කියනු ලැබේ. — නාමය

2. සමිතියක් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලුම් පත්‍රයක් ම :– — ලියාපදිංචි කිරීම

(i) රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ආකෘති පත්‍රයක් අනුව ම විය යුතුය ;

(ii) සමිතියේ සෑම මුල් සාමාජිකයා විසින් ම අත්සන් කර තිබිය යුතුය. සමිතියේ මුල් සාමාජිකයෝ ලියාපදිංචි කළ සමිති වෙත්නම්, ඒ ලියාපදිංචිකළ සමිතිවල අතුරු ව්‍යවස්ථාවලින් අත්සන් කිරීමට බලය ලත් කෙනෙකු බැගින් අත්සන් කර තිබිය යුතුය ;

(iii) සමුපකාර සමිතියේ යෝජිත කටයුතු සම්බන්ධයෙන් ආර්ථික ශක්‍යතා වාර්තාවක් සමග එවිය යුතුය.

3. සමිතියක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්තුමා විසින් ප්‍රතික්ෂේප කළහොත් ලියාපදිංචි කිරීමට යවන ලද ඉල්ලුම් පත්‍රයට අත්සන් කරන ලද ඕනෑම කෙනෙකු විසින් ඊට විරුද්ධව ඇමතිතුමාට ආයාචනයක් ඉදිරිපත් කළහැකි වන අතර, එවැනි ආයාචනයක් ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම ගැන රෙජිස්ට්‍රාර්තුමා විසින් දන්වන ලද දින සිට දින තිහක් ඇතුළත ලිඛිතව කළ යුතුය. — ලියාපදිංචි [illegible] ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඇමතිතුමාට ආයාචනය කිරීම.

4. සමිතියක් ලියාපදිංචි කළ විට රෙජිස්ට්‍රාර්තුමා විසින් :–

(i) මේ සමග ඇති උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතුය. ඒ සමගම සමිතියේ පොත්පත් තබන භාෂාවෙන් සකස් කරන ලද සමුපකාර සමිති පනතේ හා ඒ යටතේ පනවා ඇති රීතිවල පිටපත් ද නිකුත් කළ යුතුය.

(ii) ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය සමග එවන ලද අතුරු ව්‍යවස්ථා පිටපතක් අත්සන් කර සමිතියට ආපසු යැවිය යුතුය.

සාමාජිකත්වය.

5. ලියාපදිංචි කරන ලද සමිතියකට සාමාජිකයින් ඇතුළත් කරගත යුත්තේ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව හා එම අතුරු ව්‍යවස්ථා වලින් නියමිත කොන්දේසිවලට යටත් ව ය.

6. ඕනෑම ලියාපදිංචි කළ සමිතියකට එහි අතුරු ව්‍යවස්ථා අනුව හා එම අතුරු ව්‍යවස්ථා වලින් නියමිත කොන්දේසිවලට යටත්ව වෙනත් ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකත්වයට ඇතුළත් කර ගත හැකි ය.

7. ලියාපදිංචි කළ සමිතියක ඕනෑම සාමාජිකයෙකුට තමාගෙන් සමිතියට අයවිය යුතු ණයක් නොමැති නම් හෝ සමිතියට අයවීමට තිබෙන ණයකට තමා ඇපකරුවෙකු නොවේ නම් හෝ ලේකම් තැනට මසක් කලින් ලියවිල්ලකින් දැනුම් දී සමිතියෙන් අස්විය හැකිය.

8. ලියාපදිංචි කරන ලද සමිතියක අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් යම්කිසි කරුණක් නිසා එම අතුරු ව්‍යවස්ථාවෙහි නියම කර ඇති අන්දමට සාමාජිකයින් අස් කිරීමට සමිතියට බලය ඇති වේ.

9. ලියාපදිංචි කළ සමිතියක ඕනෑම සාමාජිකයෙකුට සාමාජිකත්වය සඳහා සමිතියේ අතුරු ව්‍යවස්ථා වලින් නියමිත සුදුසුකම්වලින් කිසිවක් නැතිවී ගියහොත් ඔහුගේ සාමාජිකත්වය ද නැති වේ. එවිට සමිතියේ කාරක සභාව විසින් ඔහුගේ නාම සාමාජික ලේඛනයෙන් අස්කළ යුතුය.

10. (i) සීමා රහිත වගකීම ඇතිව ලියාපදිංචි කරන ලද සමිතියක යම්කිසි සාමාජිකයෙකු සමිතියෙන් අස්වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් හෝ ඔහුට අයිති කොටස් ගැනීම සඳහා ඔහු විසින් හෝ ඔහුට කලින් ඒ කොටස් අයිතිව තිබූ කෙනෙකු විසින් හෝ ගෙවන ලද මුදල්, අතුරු ව්‍යවස්ථාවලින් නියමිත කාලය ගත වූවාට පසු පොලියක් නොමැතිව ආපසු ලබා ගැනීමට ඔහුට බලය ඇති වේ.

(ii) සීමාසහිත වගකීම ඇතිව ලියාපදිංචි කරන ලද සමිතියක යම්කිසි සාමාජිකයෙකු සමිතියෙන් අස්වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් හෝ ඔහුට අයිති කොටස් ගැනීම සඳහා ගෙවන ලද මුදල් ආපසු ලබා ගත හැක්කේ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල ඒ සම්බන්ධයෙන් පනවා ඇති කොන්දේසි අනුව පමණක්ම ය.

සාමාජික සංඛ්‍යාව.

11. ප්‍රාථමික සමිතියක සාමාජික සංඛ්‍යාවට සීමාවක් නොමැත. එහෙත් නිෂ්පාදන, කාර්මික හෝ කම්කරු සමුපකාර සමිතියක් වූ කලී එහි කටයුතු වත්කම් හා බැරකම් ගැන සලකා බලා එකී සමිතියේ ආර්ථික ප්‍රරෝහණ ශක්තිය තහවුරුවීම් වස්, රෙජිස්ට්‍රාර්තුමාගේ අනුමැතිය ඇතිව සාමාජික සංඛ්‍යාවට සීමාවක් නියම කළ හැකි ය.

සාමාජික නාම ලේඛනය.

12. සෑම ලියාපදිංචි කළ සමිතියක් ම පහත සඳහන් කරුණු දක්වන නාමලේඛනයක් තබාගත යුතු ය :–

(i) සෑම සාමාජිකයාගේම නම, ලිපිනය, රක්ෂාව, ඔහුට අයත් කොටස් ගණන ;

(ii) එක එක සාමාජිකයාගේ වයස ;

(iii) ඒ ඒ සාමාජිකයාගේ නම සාමාජික නාමලේඛනයෙහි ඇතුළත් කළ දිනය ;

(iv) සාමාජිකයෙකුගේ සාමාජිකත්වය නැති වූ දිනය ;

(v) එක එක සාමාජිකයා විසින් නම් කරන ලද තැනැත්තන් වෙතොත් ඔවුන්ගේ නම් ;

(vi) එක එක සාමාජිකයාගේ අත්සන හෝ මහපට ඇඟිලි සටහන.

නම් කරනු ලබන අය.

13. (i) සමුපකාර සමිති පනතේ 27 වැනි වගන්තියේ විධිවිධාන සඳහා ලියාපදිංචි කරන ලද සමිතියක සාමාජිකයෙකු විසින් යම් කිසිවකු නම් කරන විට එය ලිඛිතව කර එය සහතික කරන සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට අත්සන් කළ යුතුය.

(ii) කොටස් ප්‍රාග්ධනය ඇති ලියාපදිංචි කරන ලද සමිතියක සාමාජිකයෙකුට එක කොටසකට වඩා අයිති වුවහොත් මිස එක් කෙනෙකුට වඩා නම් කිරීමට බලයක් නැත.

(iii) ලියාපදිංචි කරන ලද සමිතියක යම්කිසි සාමාජිකයෙකු විසින් එක් කෙනෙකුට වැඩි ගණනක් නම් කළහොත් ඒ එක් එක් තැනැත්තාට පැවරිය යුතු කොටස් ගණන හෝ කොටස්වලින් නියමිත ප්‍රමාණය හෝ ඒ සාමාජිකයාගේ වෙනත් සම්බන්ධතාවයක් සමිතියේ තිබේ නම් එය ඒ එක එක තැනැත්තා අතර බෙදාදිය යුතු ආකාරය ද ඒ නම් කරන අවස්ථාවේ දී ම සඳහන් කළ යුතුය.

(iv) නම් කරනු ලබන සෑම තැනැත්තාගේම නම නාම ලේඛනයෙහි සඳහන් කළ යුතුය.

(v) ලියාපදිංචි කරන ලද සමිතියක අතුරු ව්‍යවස්ථාවල අන්‍ය නියමයක් නොමැති නම්, නම් කරනු ලැබූ කෙනෙකුට සාමාජිකයාගේ මරණීන් පසු ඔහුගේ කොටස්වල හෝ අන්‍ය සම්බන්ධතාවයක හෝ අයිතිය පැවරීමේ දී ඒ සාමාජිකයා විසින් ඒ සඳහා ගෙවන ලද මුදල ම විය යුතුය.

(vi) නම් කරනු ලැබූ බාල වයස්කරුවෙකුට යම්කිසි මුදලක් ගෙවූ විට ඔහු විසින් හෝ ඔහුගේ භාරකරු විසින් හෝ දෙන ලද ලදුපත ඒ මුදල් ගෙවන ලද ඒ ලියාපදිංචි කළ සමිතියේ වගකීම ඉටු කළ බවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් වේ.

14. වගකීම සීමාසහිත වුව ද සීමාරහිත වුව ද ලියාපදිංචි කළ සමිතියක එහි සම්පූර්ණ කොටස් මුදලින් පහෙන් පංගුවකට වඩා අයිතිකර ගැනීමට සාමාජිකත්වය දරන ලියාපදිංචි කළ සමිතියකට හැර අන්‍ය කිසිම සාමාජිකයෙකුට බලය නැති වේ. අයිතිකර ගත හැකි උපරිම ප්‍රමාණය.

15. (i) කොටස් ප්‍රාග්ධනයක් නොමැති ලියාපදිංචි කළ සමිතියක නම් එහි මුදල්වලින් කිසිවක් ලාභාංශ වශයෙන් හෝ වෙනත් අන්දමකට හෝ සාමාජිකයින් අතර බෙදිය නොහැකිය. එහෙත් සකසුරුවම් සමිතියක් කෙරෙහි මේ ඡේදයේ විධිවිධාන බලපාන්නේ නැත. ලාභ බෙදීම.

(ii) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක මුදල් හෝ එයින් යම්කිසි කොටසක් හෝ පහත සඳහන් කරුණු සම්පූර්ණ වුවහොත් මිස ලාභාංශ හෝ ප්‍රතිදාන හෝ ප්‍රසාද මුදල් හෝ වශයෙන් ඒ සාමාජිකයින් හෝ නිලධාරීන් අතර නොබෙදිය හැකිය :-

(අ) ශුද්ධ ලාභය ගණන් ගැනීමට පෙර වර්ෂය තුළ සමිතියට ඇතිවී තිබෙන සම්පූර්ණ වියදම ලාභ අලාභ ගිණුමට හර කර තිබීම හා,

(ආ) රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ලබාගැනීම.

(iii) ලියාපදිංචි කළ සමිතියකින් තැන්පත්කරුවෙකුට හෝ ණය හිමියෙකුට හෝ ගෙවිය යුතු යම්කිසිවක් නොගෙවා තිබිය දී ලාභාංශ වශයෙන් හෝ ප්‍රතිදාන වශයෙන් හෝ කිසිවක් ගෙවිය නොහැකිය.

(iv) ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය සඳහා 10%ට අධික වන පරිදි ලාභාංශ ගෙවීමට කිසිම ලියාපදිංචි කළ සමිතියකට බලයක් නොමැතිය.

(v) බැංකුවක් හැර සාමාජිකයෙකු නොවන අන් කිසිවෙකුගෙන් ණය හෝ තැන්පත් හෝ වෙනත් ණය පහසුකම් හෝ ලබන තෙක් කිසිම ලියාපදිංචි කරන ලද සමිතියක් -

(අ) ලාභාංශ නොගෙවිය යුතු යයි හෝ,

(ආ) රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කළ හැකි අඩු ප්‍රමාණයකට ලාභාංශ ගෙවිය යුතු යයි හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් අණ කළ හැකිය.

16. (i) සෑම ලියාපදිංචි කළ සමිතියක්ම ණය වශයෙන් හෝ තැන්පත් වශයෙන් හෝ වෙනත් අයුරින් හෝ සාමාජිකයන් නොවන්නන්ගෙන් ලබාගත හැකි උපරිම ප්‍රමාණය සමිතියේ මහා සභා රැස්වීමක දී වරින්වර නියම කර ගත යුතුය. සමිතියේ උපරිම වගකීම.

(ii) මේ රීතියේ (i) වන ඡේදයේ සඳහන් පරිදි උපරිම ප්‍රමාණයක් නියම කිරීමෙන් යම්කිසි ලියාපදිංචි කරන ලද සමිතියකට දුෂ්කරතාවයක් ඇති වේ යයි රෙජිස්ට්‍රාර්තුමාට වැටහුණහොත් අවශ්‍ය යයි තමා සළකන යම්කිසි කාල පරිච්ඡේදයකට එකී සමිතියට එවැනි උපරිම ප්‍රමාණයක් නියම කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

මහා සභා රැස්වීම්.

17. (i) සෑම ලියාපදිංචි කරන ලද සමිතියක්ම පහත සඳහන් කරුණු ඇතුළුව අවශ්‍ය කටයුතු කිරීම සඳහා එහි අතුරු ව්‍යවස්ථාවල සඳහන් පරිදි මහා සභා රැස්වීම් කළින් කළ පැවැත්විය යුතුය :-

(අ) ණය වශයෙන් හෝ තැන්පත් වශයෙන් හෝ වෙනත් අයුරින් හෝ සාමාජිකයන් නොවන්නන්ගෙන් ලබාගත හැකි උපරිම ප්‍රමාණය නියම කිරීම ;

(ආ) සාමාජිකයන්ට ණය දෙන සමිතියක් නම් එක එක සාමාජිකයාට දිය හැකි උපරිම ණය ප්‍රමාණය නියම කිරීම ;

(ඇ) කාරක සභිකයින් තෝරාපත් කිරීම ;

(ඈ) රෙජිස්ට්‍රාර්තුමාගේ වාර්තාවක් වෙතොත් එයද ගිණුම් පිළිබඳ වාර්තාව ද, රෙජිස්ට්‍රාර්තුමා විසින් පත් කරන ලද ගණන් පරීක්ෂකගේ වාර්තාවද සළකා බැලීම.

(ii) ලියාපදිංචි කරන ලද සමිතියක මහා සභාව වෙත ඉදිරිපත් වන සෑම කරුණක්ම අතුරු ව්‍යවස්ථාවල අන්‍ය පිළිවෙලක් නිශ්චය වශයෙන් සඳහන් කර නොමැති නම් ඒ ඒ රැස්වීමට පැමිණි ඡන්දය දෙන අයගේ වැඩි ඡන්දය අනුව තීරණය විය යුතුය.

සමුපකාර සමිති පනතේ 3(1)(අ) වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සමිතියක සාමාජිකයෙකුට ඒ සමිතියේ මහා සභා රැස්වීමේදී හිමිවන්නේ එක ඡන්දයක් පමණක්මය. ලියාපදිංචි කරන ලද සමිතියක නියෝජිතයන්, වෙනත් ලියාපදිංචි කරන ලද සමිතියක මහා සභා රැස්වීමකට පැමිණිවිට, ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව ඡන්දය පාවිච්චි කළ යුතුය.

ඡන්ද ගණන සමාන වූ විට සභාපතිතැනට තීරක ඡන්දයක් ඇති වේ.

(ii) ලියාපදිංචි කරන ලද සමිතියක සාමාජිකයෙක් වන වෙනත් ලියාපදිංචි කළ සමිතියක් ඒ සමිතියේ මහා සභා රැස්වීමක දී තම සමිතිය නියෝජනය කිරීමට තම සාමාජිකයන් අතුරින් පහත සඳහන් අය පත්, නොකළ යුතු වේ -

(අ) තමා විසින් ගන්නා ලද ණයක් හෝ ණය හෝ ඒ සමිතියට හෝ ලියාපදිංචි කරන ලද වෙනත් සමිතියකට හෝ ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතියක ඇවරකරුට හෝ ආපසු ගෙවීම ඒ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් නියමිත යම්කිසි කාලයක් හෝ එසේ කාලයක් නියම කර නොමැති නම්, තුන් මසකට අධික කාලයක් හෝ අතපසු කර තිබෙන කෙනෙක් ;

(ආ) ඒ සමිතියට හෝ ලියාපදිංචි කළ වෙනත් සමිතියකට හෝ ඇවරකරුවෙකුට හෝ වෙනයම් කිසිම කාරණයක් නිසා ගෙවිය යුතු මුදලක් ගෙවීම අතපසු කර ඇති කෙනෙක්.

මහා සභා රැස්වීම හෝ කාරක සභා රැස්වීම් කැඳවීමටත් ඒවාට පැමිණීමටත් රෙජිස්ට්‍රාර්තුමා වෙත ඇතිවන බලතල.

18. (i) රෙජිස්ට්‍රාර්තුමාට ද, සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් එතුමාගෙන් ඒ සඳහා බලයලත් කෙනෙකුට ද, ඕනෑම අවස්ථාවක දී තමා නියම කරන අයුරු නියම කරන වේලාවක හා ස්ථානයක දී ඕනෑම ලියාපදිංචි කළ සමිතියක විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට බලය ඇති වේ. එවැනි රැස්වීමක දී මහා සභාවේ කටයුතු කිරීම සඳහා (තුනකට අඩු වුවහොත් මිස) පැමිණ සිටින සංඛ්‍යාව ගණපූරණය වන්නේ ය. එවැනි මහා සභා රැස්වීමකට අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ බලය ඇතුළුව සමිතියේ යථා පරිදි කැඳවන ලද මහා සභා රැස්වීමකට ඇති සියළුම බලතල හිමි වේ.

(ii) රෙජිස්ට්‍රාර්තුමාට ද, එතුමාගෙන් ඒ සඳහා ලිඛිත බලයලත් කෙනෙකුට ද, ඕනෑම ලියාපදිංචි කරන ලද සමිතියක කාරක සභා රැස්වීමක් ඕනෑම අවස්ථාවක දී තමන් නියම කරන අයුරු නියම කරන වේලාවක හා ස්ථානයක දී කැඳවීමට බලය ඇති වේ. එවැනි රැස්වීමකදී පැමිණ සිටින සංඛ්‍යාව (තුනකට අඩුවුවහොත් මිස) ගණපූරණය වන්නේ ය. එවැනි කාරක සභා රැස්වීමකට සමිතියේ යථා පරිදි කැඳවන ලද කාරක සභා රැස්වීමක ඇති සියළු බලතල හිමිවේ.

(iii) රෙජිස්ට්‍රාර්තුමා විසින් හෝ රෙජිස්ට්‍රාර්තුමාගෙන් බලයලත් කෙනෙකු විසින් හෝ 18(i) රීතිය යටතේ විශේෂ මහා සභා රැස්වීමක් හෝ 18(ii) රීතිය යටතේ කාරක සභා රැස්වීමක් හෝ කැඳවූ විට අවශ්‍යයයි තමාට වැටහෙන සමිතියේ පොත්පත් හෝ ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට හෝ එසේ බලයලත් තැනැත්තාට හෝ බලය ඇති වේ. එවැනි සෑම නියෝගයක්ම අනුව ක්‍රියා කිරීම සමිතියේ ලේකම්තැනගේ

යුතුකම වේ. රෙජිස්ට්‍රාර්තුමාට හෝ එතුමාගෙන් බලයලත් කෙනෙකුට හෝ 18(i) හෝ 18(ii) රීති යටතේ කැඳවන ලද ඕනෑම රැස්වීමක මුලසුන දැරීමට හැකි ය. එහෙත් ඒ අයට ඡන්දයක් හිමිවන්නේ නැත. ඡන්ද ගණන සමාන වූ විට සභාපතිතැනට තීරක ඡන්දයක් දිය හැකි ය.

(iv) රෙජිස්ට්‍රාර්තුමාට හෝ විශේෂ හෝ සාමාන්‍ය ලිඛිත නියෝගයකින් එතුමාගෙන් බලයලත් කෙනෙකුට හෝ ඕනෑම ලියාපදිංචි කළ සමිතියක මහා සභා රැස්වීමකට හෝ කාරක සභා රැස්වීමකට හෝ පැමිණීමටත් එහිදී කථා කිරීමටත් බලය ඇති වේ.

එහෙත් රෙජිස්ට්‍රාර්තුමාට හෝ එතුමාගෙන් එසේ බලයලත් කෙනෙකුට හෝ එවැනි රැස්වීමකදී ඡන්දය දීමේ බලය ඇති නොවේ.

19. සෑම ලියාපදිංචි කරන ලද සමිතියකම කාරක සභාවක් තිබිය යුතුය. ලියාපදිංචි කරන ලද සමිතියක කාරක සභිකයින් තෝරාපත් කිරීම ඔවුන්ගේ වැඩ අත්හිටුවීම හෝ ඔවුන් කාරක සභාවෙන් ඉවත් කිරීම සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව කළ හැකිය. ලියාපදිංචි කරන ලද සමිතියක අතුරු ව්‍යවස්ථා අනුව ප්‍රාදේශික කාරක සභාව පිහිටුවීමට අවකාශ ඇත්තේ නම්, එවැනි ප්‍රාදේශික කාරක සභාවක සාමාජිකයන් තෝරා පත් කිරීම ඔවුන්ගේ වැඩ අත්හිටුවීම හා ඔවුන් එම ප්‍රාදේශීය කාරක සභාවෙන් ඉවත් කිරීම අතුරු ව්‍යවස්ථා පරිදි කළ හැකි ය. කාරක සභාව

අළුත් සමුපකාර සමිතියක් ලියාපදිංචි කළ විට ඉහත සඳහන් විධිවිධාන කෙසේ වෙතත් එය නොතකා ඒ සමිතියේ තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලයකට පුද්ගලයන් නම් කිරීමටත්, ඒ තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඒ පුද්ගලයන් ඉවත් කිරීමටත්, රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇති වේ. රෙජිස්ට්‍රාර්තුමා විසින් නම් කරනු ලබන තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලයකට මහා සභාව හා කාරක සභාවක සියළු බලතල හිමිවේ. එහෙත් එසේ නම් කරන ලද මණ්ඩලයකට දොළොස් මසකට අධික කාලයක් ක්‍රියා කළ හැකි නොවේ.

20. ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථාවල විධානයන් කෙසේ වෙතත් එම සමිතියේ කාරක සභාවට එක් කෙනෙකු හෝ වැඩි දෙනෙකු නම් කිරීමටත්, එසේ නම් කරන ලද අය අතුරින් සභාපති හෝ උප සභාපති හෝ ඒ දෙදෙනාම හෝ නම් කිරීමටත් රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇතිවේ. රෙජිස්ට්‍රාර්තුමා විසින් සභාපති හෝ උප සභාපති හෝ එසේ නම් කළවිට කාරක සභාව විසින් තෝරා පත් කරනලද සභාපතිගේ හෝ උප සභාපතිගේ හෝ නිලය එම නම් කිරීමෙන්ම අහිමි වේ.

21. (i) පහත සඳහන් අය ලියාපදිංචි කළ සමිතියක කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශික කාරක සභාවකට හෝ තෝරාපත් කළ නොහැකි ය :– කාරක සභිකත්වයට නුසුදුසුකම්

(අ) (iii) වෙනි ඡේදයේ විධිවිධානවලට යටත්ව, වයස අවුරුදු 21ට අඩු කෙනෙක් ;

(ආ) බංකොලොත්කාරයෙකුවීමට ඉල්ලා සිටින කෙනෙක් හෝ බංකොලොත් කෙනෙකු වශයෙන් උසාවියක් පිළිගත් කෙනෙක් ;

(ඇ) සිහිය විකල වූ කෙනෙක් ;

(ඈ) පසුගිය තුන් වර්ෂය ඇතුළත, දුශ්චරිතය සම්බන්ධ නඩුවකින් වරදකරුවෙකු වූ කෙනෙක් හෝ තුන් මාසයක් හෝ ඊට අධික කාලයක් හිර දඬුවම් ලැබීමට නියමවූ කෙනෙක් ;

(ඉ) සමිතියට හෝ වෙනත් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඇවරකරුවෙකුට හෝ ගෙවිය යුතු මුදලක් ගෙවීම තුන් මසකට අධික කාලයක් පැහැර හැර ඇති කෙනෙක් හෝ සමිතියට හෝ වෙනත් සමිතියකට හෝ ඇවරකරුවෙකු හෝ ගෙවිය යුතු වෙන යම් මුදලක් ආපසු ගෙවීම පැහැර හැර තිබෙන කෙනෙක් ;

(ඊ) සමිතිය සමග ඇති කර ගන්නා ලද ගිවිසුමක් හෝ සමිතියේ යම් විකිණීමක් හෝ මිළයට ගැනීමක් හෝ සමිතියේ මුදල් සම්බන්ධයෙන් එවකට ඇති කරගෙන තිබෙන්නාවූ ද, ඇති කර ගැනීමට විධිවිධාන සළස්වා ගෙන යන්නා වූ ද, ගිවිසුමක් හෝ ගනුදෙනුවක් පිළිබඳව සාමාජිකයෙකු හෝ සේවකයෙකු හෝ වශයෙන් හැර තමන් විසින්ම හෝ අන් අයකුගේ මාර්ගයෙන් හෝ සම්බන්ධයක් ඇති කෙනෙක් ;

(උ) පසුගිය තුන් වර්ෂය තුළ පිට පිටම කාරක සභාවට තෝරා පත් වූ කෙනෙක් ;

(ඌ) මහා සභාවේ අදහස පරිදි සමිතියේ දියුණුවට බාධක යම් වෙළඳාමක හෝ වෙනත් කටයුත්තක තමන්ගේම හෝ අන් අයෙකුගේ මාර්ගයෙන් හෝ යෙදී සිටින කෙනෙක්.

(ii) කාරක සභාවේ හෝ දිස්ත්‍රික් කාරක සභාවේ හෝ ප්‍රාදේශික කාරක සභාවේ හෝ තෝරා පත්කර ගත් සාමාජිකයෙකුගේ නිලය පහත සඳහන් කරුණක් නිසා ඒ කරුණෙන් ම නැති වේ :-

(අ) සමිතියේ සාමාජිකත්වය නැතිවීම ;

(ආ) බංකොලොත්කාරයෙකුවීමට ඉල්ලා සිටීම හෝ බංකොලොත්කාරයෙකු වශයෙන් උසාවියක් විසින් පිළිගැනීම ;

(ඇ) සිහිය විකලවීම ;

(ඈ) දුශ්චරිතය සම්බන්ධයෙන් නඩුවකින් වරදකරුවෙකුවීම හෝ තුන් මසකට අධික කාලයක් සිරදඬුවම් ලැබීමට නියම වීම ;

(ඉ) මහා සභාවේ අදහස පරිදි සමිතියේ දියුණුවට බාධක යම් වෙළඳාමක් හෝ වෙනත් කටයුත්තක් ආරම්භ කිරීම හෝ එවැනි වෙළඳාමක හෝ කටයුත්තක සම්බන්ධතාවයක් ඇතිකර ගැනීම ;

(ඊ) සමිතියේ අතුරු ව්‍යවස්ථාව අනුව, කාරක සභාවේ හෝ දිස්ත්‍රික් කාරක සභාවේ හෝ ප්‍රාදේශික කාරක සභාවේ හෝ සාමාජිකයෙකුවීමට සුදුසුකම් නැතිවීම.

(iii) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයන් පේෂකර්මාන්තයෙහි යෙදී සිටින්නන් හෝ පාසැල් ශිෂ්‍යයන් හෝ වෙතොත් එවැනි සමිතියක සාමාජිකයෝ වයස අවුරුදු 21ට අඩු වුවත්, කාරක සභාවට තෝරාපත් කර ගැනීමට සුදුසු වෙත්.

(iv) ලියාපදිංචි කළ සමිතියක කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශික කාරක සභාවට හෝ තෝරාපත් කරනු ලැබූ කෙනෙක් එසේ තෝරාපත් වූ විගසම තමා එසේ තෝරාපත් කිරීමට නුසුදුසු නොවන බවට ප්‍රකාශනයක් සමිතියේ අතුරු ව්‍යවස්ථාවල නියමිත ආකාරයට කළ යුතුය.

(v) කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය කාරක සභාවකට හෝ තෝරාපත් කර ගන්නා ලද කෙනෙක් 21 (iv) රීතිය අනුව ප්‍රකාශනයක් කළවිට ඒ ප්‍රකාශනය අසත්‍ය යයි දැනගන්නට ලැබුණොත් ඒ ප්‍රකාශනය අසත්‍ය බව දැන ගන්නට ලැබී දෙවර්ෂයක කාලයක් ගතවන තුරු කිසිම සමුපකාර සමිතියක කිසිම නිලයක් දැරීමට ඔහු නුසුදුසු වේ.

22. (i) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකුට වැටුප් මුදල්, පාරිතෝෂික මුදල් හෝ වෙනත් පාරිශ්‍රමිකයක් ලබාගැනීමට පුළුවන් වන්නේ මහා සභාවේ පූර්ව අනුමැතිය ඇතිවත්, රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ප්‍රමාණ අනුවත් පමණක් ය.

(ii) ලියාපදිංචිකළ සමිතියක කාරක සභිකයෙකු හෝ වෙනත් නිලධාරියෙකු හෝ තමාගේ සේවය සඳහා ලබානොගත යුතු යම් මුදලක් ලබාගතහොත්, ඒ මුදල සමිතියට ආපසු ගෙවන ලෙස නියම කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇති වේ.

23. ලියාපදිංචි කළ සමිතියක මහා සභාවට වෙන්කර තිබෙන බලතල හැර සමිතියේ අන්‍ය සියළුම බලතල සමිතියේ මහා සභා රැස්වීමකදී හෝ අතුරු ව්‍යවස්ථාවලින් හෝ යථා පරිදි නියම කරන ලද රෙගුලාසිවලට හෝ සීමාවලට යටත්ව කාරක සභාව සතු වේ.

24. ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව වෙත පැවරෙන වෙනත් කටයුතු කළයුතු අතර පහත සඳහන් කටයුතු ද කළයුතු වේ :-

(අ) සමුපකාර සමිති පනත, මේ රීති, සමිතියේ අතුරු ව්‍යවස්ථා හා කාරක රීති හා සමිතියේ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්තුමා විසින් නිකුත් කරන වෙනත් සාමාන්‍ය විධානයන් අනුගමනය කිරීම ;

(ආ) සත්‍ය වූද, නිවැරදි වූද, ගණන් තැබීම ;

(ඇ) වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් සත්‍ය ගිණුම් තැබීම ;

(ඈ) සමිතියේ වත්කම් සුරක්ෂිතව තබා ගැනීමට විධිවිධාන සැළැස්වීම ;

(ඉ) නිවැරදි සාමාජික ලේඛණයක් තැබීම ;

(ඊ) පරීක්ෂිත ලාභ අලාභ ගිණුම හා ශේෂ පත්‍රයද, ගණන් පරීක්ෂක තැනගේ වාර්තාවද, රෙජිස්ට්‍රාර්තුමාගෙන් ලැබී දෙමසක් ඇතුළත සමිතියේ මහා සභා රැස්වීමකට ඉදිරිපත් කිරීම ;

(උ) සමිතියේ පොත්පත් බැලීමට බලයලත් ඕනෑම කෙනෙකුට ඒවා පරීක්ෂා කිරීමට උපකාර කිරීම ;

(ඌ) සමිතියේ සාමාජිකයින්ට ණය මුදල් දුන් විට ඒ ණය මුදල් දෙන ලද කටයුත්ත සඳහාම පරිහරණය කරන බව සොයා බැලීම ;

(එ) සමුපකාර සමිති පනතේ 45 වැනි වගන්තිය අනුව, රෙජිස්ට්‍රාර්තුමා විසින් දන්වා එවන අඩුලුහුඩුකම් මග හරවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

25. ලියාපදිංචි කළ සමිතියක් රජයේ හෝ වෙනත් සංයුක්ත මණ්ඩලයක හෝ නියෝජිතයෙකු වශයෙන් සේවය කරන කල ඒ බලධාරියා විසින් නිකුත් කරනු ලබන උපදෙස් අනුව, ඒ සේවය ඉටු කිරීම කාරක සභාවේ හා සෑම නිලධාරියෙකුගේ ද, සේවකයෙක්ගේ ද යුතුකම වේ.

26. ලියාපදිංචි කරන ලද සමිතියක කාරක සභාව තම කාර්යය හා යුතුකම් බුද්ධිමත්ව ඉටු කළ යුතුය. සෑම විටම ඔවුන් නීතිය, මේ රීති, සමිතියේ අතුරු ව්‍යවස්ථා හා කාරක රීතිවල විධිවිධාන අනුවද, සමිතියේ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්තුමා විසින් නිකුත් කරන සාමාන්‍ය විධාන අනුවද, ක්‍රියා කළ යුතුය. කාරක සභාව නිසි පරිදි බුද්ධිමත් ලෙස ක්‍රියා නොකිරීම නිසා හෝ නීතිය, මේ රීති සමිතියේ අතුරු ව්‍යවස්ථා හා කාරක රීති අනුවද, රෙජිස්ට්‍රාර්තුමාගේ සාමාන්‍ය විධාන අනුව ද, ක්‍රියා නොකිරීම නිසා සමිතියට ඇතිවන යම්කිසි අලාභයකට හෝ පීඩාවකට හෝ සමිතිය යටත්වන යම් දඩුවමකට හෝ කාරක සභිකයන් සාමූහිකව හා වෙන් වෙන්ව වගකිව යුතු වේ.

27. ලියාපදිංචි කළ සමිතියක් ණය දෙන සමිතියක් නම්, එහි කාරක සභිකයින්ගේ ණයවල එකතුව සමිතියේ කාරක ප්‍රාග්ධනයෙන් සියයට විසි පහකට වැඩි නොවිය යුතුය. එහෙත් රෙජිස්ට්‍රාර්තුමාගේ අදහස පරිදි සමිතියේ සියළුම සාමාජිකයින්ගේ ණය අවශ්‍යතා සඳහා තරම් වන මුදල් ඇති සමිතියක් කෙරෙහි නම් රීතිය බලපාන්නේ නැත.

නිලධාරීන් හා සේවකයන්.

28. ලියාපදිංචි කළ සමිතියකට 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව මිස, කිසිවකු සේවකයෙකු වශයෙන් පත් කළ නොහැකිය.

අනිවාර්යය අතුරු ව්‍යවස්ථා.

29. ලියාපදිංචි කළ සමිතියක් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතුය :–

(i) සමිතියේ නම,

(ii) සමිතියේ ලිපිනය,

(iii) සමිතියේ පරමාර්ථ,

(iv) සමිතියේ මුදල් යෙදිය හැකි කරුණු,

(v) සමිතියේ සාමාජිකත්වයට සුදුසුකම්, සාමාජිකයින් ඇතුළත් කර ගැනීමේ කොන්දේසි, ඇතුළත් කර ගැනීමේ ආකාරය,

(vi) සමිතියේ සාමාජිකයින්ගේ වගකීමේ ප්‍රමාණය හා ස්වභාවය,

(vii) සමිතියේ සාමාජිකයින් අස්වීම හා ඉවත් කිරීම හා ඔවුන්ට කළයුතු ගෙවීම,

(viii) සමිතියේ සාමාජිකයින්ගේ කොටස් හා වෙනත් සම්බන්ධතාවයන් පැවරීම,

(ix) තැන්පත් සඳහා උපරිම පොලී ප්‍රමාණය ඇතුළුව, සමිතියේ මුදල් සපයා ගන්නා ආකාරය,

(x) සමිතියේ මහා සභා රැස්වීම් හා ඒ සභා රැස්වීම් පැවැත්වීමේ පිළිවෙල හා සභා රැස්වීම්වල බලතල.

(xi) සමිතියේ කාරක සභිකයින් හා වෙනත් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් සේවයෙන් ඉවත් කිරීම හා කාරක සභාවේ හා වෙනත් නිලධාරීන්ගේ බලතල හා යුතුකම්,

(xii) සමිතිය වෙනුවෙන් ලියකියවිලි අත්සන් කිරීමට සමිතියේ නිලධාරියෙකුට බලය දීම. සාමාජිකයින්ට ණය දීම සඳහා මුදල් සපයා ගැනීම ලියාපදිංචි කළ සමිතියක පරමාර්ථවලට ඇතුළත් නම් පහත සඳහන් අතිරේක කරුණු සම්බන්ධයෙන් ද, අතුරු ව්‍යවස්ථා සකස් කරගත යුතුය,

(xiii) සාමාජිකයින්ගේ රක්ෂාව හා පදිංචිය,

(xiv) පහත සඳහන් කරුණු ඇතුළුව, සාමාජිකයින්ට ණය දීමේ කොන්දේසි :–

(අ) පොලී ප්‍රමාණය,

(ආ) සාමාජිකයෙකුට ණය දිය හැකි උපරිම ප්‍රමාණය,

(ඇ) ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම හා ණය අලුත් කිරීම,

(ඈ) ණය දිය යුතු කරුණු,

(ඉ) ණය වෙනුවෙන් ලබාගන්නා ඇප.

(xv) කොටස් වෙනුවෙන් හෝ ණය වෙනුවෙන් හෝ ගෙවීමට තිබෙන මුදලක් ගෙවීම පැහැර හැරීමේ ප්‍රතිඵල,

(xvi) ලාභ පිළිබඳ සුදුස්සක් කිරීම.

කාරක රීති

30. ලියාපදිංචි කළ සමිතියක් අවශ්‍ය යයි වැටහෙන පරිදි එහි අතුරු ව්‍යවස්ථාවලට යටත්ව, වරින් වර කාරක රීති සකස් කරගත යුතුය. කාරක සභාවද, සැම නිලධාරියා හා සේවකයා ද, ඒ කාරක රීති අනුව ක්‍රියා කිරීමට බැඳී සිටී.

අලාභ.

31. ලියාපදිංචි කළ සමිතියක් විසින් සමූපකාර සමිති පනතේ 21 (1)(ආ) වගන්තිය යටතේ කිසිම සාමාජිකයෙකුගෙන් අයකර ගත හැකි අලාභ වනාහි ඒ සාමාජිකයා විසින් තමා නිපදවන ද්‍රව්‍ය සියල්ලම හෝ එයින් නියමිත කොටසක් හෝ සමිතිය මගින් නොවිකිණීම හේතු කොටගෙන සමිතියට නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ නැතිවන වෙළඳාම නිසා ඇතිවන අලාභය වේ. එහෙත් සමිතිය අයකරන අලාභය සමිතිය මගින් නොවිකුණන ලද ඒ ද්‍රව්‍යවල එවකට පවතින වෙළඳපොල මිළ සහ ඉන් සියයට 10ක වත් වැඩි නොවිය යුතුය.

අයිතිවාසිකම් අත් හැර දැමීම.

32. ලියාපදිංචි කළ සමිතියකට අයවිය යුතුව ඇති ණයක් හෝ වෙනත් හිමිකමක් හෝ මහා සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව අත්හැර දැමීමට හෝ සමිතියේ පොත්පත් වලින් අස්කර දැමීමට නොහැකිය. ඒ ණය හෝ හිමිකම හෝ රු. 1,000කට අධික මුදලක් සම්බන්ධ එකක් වේ නම්, මහා සභාවේ හා රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය නොමැතිව අත්හැර දැමීමට හෝ සමිතියේ පොත්පත් වලින් අස්කර දැමීමට නොහැකිය.

අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම.

33. (i) ලියාපදිංචි කළ සමිතියකට සමූපකාර සමිති පනතේ 8 වැනි වගන්තියේ විධිවිධාන හා මේ රීතිවලට 29 වැනි රීතිය යටතේ එහි අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ හැකිය.

(ii) අතුරු ව්‍යවස්ථාවල සංශෝධනයක් කළ හැක්කේ පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, මහා සභාවක යෝජනාවක් අනුව පමණක්ය :-

(අ) සීමාරහිත වගකීම ඇති සමිතියක් නම්, ඒ මහා සභා රැස්වීමට සමිතියේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් භාගයකට අඩු නොවන ගණනක් පැමිණ සිටිය යුතුය. තවද, ඒ පැමිණ සිටින සාමාජිකයින්ගෙන් යටත් පිරිසෙයින් 3/4ක් වත් යෝජනාවට කැමැත්ත දිය යුතුය.

(ආ) සීමාසහිත වගකීම ඇති සමිතියක් නම්, සමිතියේ මහා සභා රැස්වීමට පැමිණ ඡන්දය දීමට බලය ඇති සම්පූර්ණ සංඛ්‍යාවෙන් භාගයකට වැඩි ගණනක ඡන්දය යෝජනාවට පක්ෂව ලැබිය යුතුය. ඒ ඡන්ද ලිඛිතව දිය හැකි වේ. ලිඛිත ඡන්ද ලබා ගන්නා විට, ඡන්ද පත්‍රිකා ඒ සියළුමදෙනාට යවා, ආපසු ලැබෙන ඡන්ද සමිතියේ අතුරු ව්‍යවස්ථා වලින් නියමිත ගණපූරණයක් ඇති මහා සභා රැස්වීමකදී පරීක්ෂා කර ගණන් කළ යුතුය.

(iii) මේ රීතියේ ඉහත දැක්වෙන විධිවිධාන කෙසේ වෙතත්, රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය හෝ නිර්දේශය ලැබී ඇති ඕනෑම අතුරු ව්‍යවස්ථාවක් හෝ අතුරු ව්‍යවස්ථාවක සංශෝධනයක් හෝ ඒ යෝජිත අතුරු ව්‍යවස්ථාව හෝ අතුරු ව්‍යවස්ථාවේ සංශෝධන හෝ ගැන සාකච්ඡා කරන බවට සාමාජිකයින්ට යථා පරිදි දන්වා පවත්වන ලද මහා සභාවකට පැමිණ සිටින සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකොටසකගේ ඡන්දයෙන් සභා සම්මත කර ගත හැකිය.

(iv) ලියාපදිංචි කළ සමිතියක යම්කිසි අතුරු ව්‍යවස්ථාවක සකස් කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ වහාම එයින් පිටපත් දෙකක් රෙජිස්ට්‍රාර්තුමා වෙත යැවිය යුතුය. තවද, මේ රීතියේ, අවස්ථාවෝචිත පරිදි, (ii) වෙනි හෝ (iii) වෙනි ඡේදයේ විධිවිධාන සර්වප්‍රකාරයෙන්ම ඉටු කළ බවට සමිතියේ සභාපති හා ලේකම් විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ඒ සමග යැවිය යුතුය.

34. ලියාපදිංචි කළ සමිතියකට එහි අතුරු ව්‍යවස්ථා කඩ කිරීම නිසා, සාමාජිකයින්ට දඩ ගැසීමට අතුරු ව්‍යවස්ථාවලින් අවකාශ සැලසිය හැකිය. ඒ අතුරු ව්‍යවස්ථා වලින් වෙනත් කරුණු අතරම පහත සඳහන් කටයුතු කිරීමට අවකාශ සැලසිය යුතුය :– දඩ ගැසීම්.

(අ) එවැනි දඩයක් ගැසීමට අදහස් කරන බව හා ඊට හේතු ලියවිල්ලකින් දන්වා සිටීම. එවැනි දැන්වීමක් සමිතියේ පොත්පත්වල සඳහන් සාමාජිකයාගේ ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යැවීමට හෝ සාමාජිකයාට අතින් භාරදීමට හෝ ව්‍යවස්ථා සකස් කිරීම.

(ආ) අතුරු ව්‍යවස්ථා කඩකිරීම සම්බන්ධයෙන් තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට ඒ සෑම සාමාජිකයාටම දින 14ක් කල්දීමට ඉඩ තැබීම.

(ඇ) සාමාජිකයා විසින් නිදහසට කරුණු ඉදිරිපත් නොකළ විට රුපියල් 25කට අධික නොවන දඩයක් ගැසීමට ව්‍යවස්ථා සකස් කිරීම.

(ඈ) සාමාජිකයා නිදහසට කරුණු ඉදිරිපත් කළහොත් ඒ කරුණු නිසි පරිදි කැඳවන ලද කාරක සභා රැස්වීමකදී සලකා බැලීමට සැලසීම හා සාමාජිකයාගෙන් නිදහසට කරුණු ලැබුණත්, දඩයක් ගැසීමට තීරණය කළ විට ඒ දඩය රු. 25ට අධික නොවීමට ව්‍යවස්ථා සකස් කිරීම.

35. ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයෙකු නොවන කෙනෙකුට කිසිම ණයක් නොදිය හැකිය. එහෙත් ලියාපදිංචි කළ සමිතියකට රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ඇතිව වෙනත් ලියාපදිංචි කළ සමිතියකට ණය දිය හැකිය. ණයදීම සීමා කිරීම.

36. ලියාපදිංචි කළ සමිතියකට එහි මුදල් රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ඇතිව පොදු හෝ පෞද්ගලික හෝ ආයතනයක හෝ ආයෝජනය කිරීමට පුළුවන. එහෙත් එසේ කළ හැක්කේ එසේ ආයෝජනය කිරීමට ඒ පොදු හෝ පෞද්ගලික හෝ ආයතනයට විශේෂ අවකාශ ලැබී ඇතහොත්ය. සමිතියේ අරමුදල් ආයෝජනය කිරීම.

37. සෑම ලියාපදිංචි කළ සමිතියක්ම රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ලද ගණන් පොත් හා වෙනත් ලියකියවිලි තබාගත යුතුය. සමිතියේ ගිණුම් තැබීමට සුදුසුකම් ඇති අය සේවයට බඳවා ගන්නා බවටත්, සමිතියේ ගිණුම් පොත් නිසි පරිදි තබන බවටත්, සමිතියේ පොත් පත් හා ඒ ලියකියවිලි කලට වේලාවට ලියාතබන බවටත් වගබලා ගැනීම කාරක සභාවේ යුතුකමක් වේ. ගිණුම්.

සමිතියේ ඒ ඒ ගිණුම් පොත් හා වෙනත් ලියකියවිලි තබන ඒ ඒ අය දක්වන ලේඛනයක් සමිතිය විසින් පවත්වාගෙන යන බවට කාරක සභාව විසින් වගබලාගත යුතුය. ඒ ඒ පොත් පත් හා වෙනත් ලියකියවිලි තබා ගැනීමේ වගකීම තමා භාරගත් බවට ඒ ඒ අය විසින් ඒ ලේඛනයෙහි නිසි පරිදි අත්සන් තැබිය යුතුය.

ගිණුම් පොත් හා වෙනත් ලියකියවිලි කලට වේලාවට තැබීමට අවශ්‍ය සුදුසුකම් ඇති අය සමිතියේ සේවයට බඳවාගැනීම ඕනෑකමින්ම පැහැර හරින හෝ එවැනි ගිණුම් පොත් හා වෙනත් ලියකියවිලි යථා පරිදි තබන බවට වගබලා නොගන්නා හෝ කාරක සභාවක් වරදකට වරදකරුවෙක් වේ.

38. සෑම ලියාපදිංචි කරන ලද සමිතියක්ම සාමාජිකයෙකු වශයෙන් හෝ තැන්පත්කරුවෙකු වශයෙන් හෝ ණය හිමියෙකු වශයෙන් හෝ එහි මුදල් සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වන ඕනෑම කෙනෙකුට එහි වාර්ෂික ශේෂපත්‍රය පරීක්ෂා කර බැලීමට අවකාශ දිය යුතුය.

39. සෑම ලියාපදිංචි කරන ලද සමිතියකම කාරක සභාව හෝ කාරක සභාව විසින් ඒ සඳහා පත්කරන ලද සමිතියේ නිලධාරියෙකු හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් ඒ සඳහා නියම කළ හැකි ආකාරයට වර්ෂයක් පාසා පහත සඳහන් ලේඛන පිළියෙල කර රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන කාලයක් ඇතුළත එතුමා වෙත ඉදිරිපත් කළ යුතුය :–

(i) ශේෂ පිරික්සුම හා සමිතියේ කටයුතුවලට අදාළ වෙළඳ හෝ වෙනත් ගිණුම්,

(ii) ලාභ අලාභ ගිණුම,

(iii) ශේෂ පත්‍රය.

40. (i) ඕනෑම ලියාපදිංචි කළ සමිතියකට පහත සඳහන් කටයුතු කරන ලෙස ලියවිල්ලකින් අණ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ :–

(අ) ඒ නියෝගයෙන් නිශ්චය කළ හැකි සමිතියේ ගිණුම් හා පොත් පත් රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන යම්කිසි දිනයක් දක්වා ලියවීම,

(ආ) තමාට අවශ්‍ය ඕනෑම වාර්තාවක් ඒ නියෝගයේ සඳහන් කාලයක් ඇතුළත එහි සඳහන් ආකාරයට එවීම.

(ii) ඕනෑම ලියාපදිංචි කරන ලද සමිතියක් (i) ඡේදය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියා නොකළහොත් රෙජිස්ට්‍රාර්තුමා විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකු ලවා ඒ ගිණුම් හෝ පොත් පත් ලියවා ගැනීමටත්, වාර්තා සකස් කරවා ගැනීමටත් රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

රෙජිස්ට්‍රාර්තුමා විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකු ලවා යම් කිසි සමිතියක ගිණුම් හා පොත්පත් ලියවූ විටත්, වාර්තා සකස් කරවා ගත් විටත්, ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව නියම කර ඒ ප්‍රමාණය ගෙවන ලෙස සමිතියට අණ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ. ඒ මුදල සමිතිය විසින් නොගෙවුවහොත්, ඒ ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් කෙනෙකු වෙත ඉල්ලුම් කර එය අයකර ගැනීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ. එසේ ඉල්ලා සිටි විට, ඒ මහෙස්ත්‍රාත්තුමා තමා විසින් පනවනු ලැබූ දඩයක් වශයෙන් ඒ ප්‍රමාණය අය කර ගැනීමට ක්‍රියා කළ යුතුය.

ලියාපදිංචි කරන ලද සමිතියක පොත් පත් ලිවීමට රෙජිස්ට්‍රාර්තුමා විසින් බලය පවරන ලද තැනැත්තෙකු රජයේ නිලධාරියෙක් වේ නම්, ඔහුට ගෙවන ලද හෝ ඒ සඳහා අයකර ගන්නා ලද හෝ මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

විගණනය.

41. (i) ලියාපදිංචි කළ සමිතියක විගණනය රෙජිස්ට්‍රාර්තුමා විසින් බලය පවරන ලද්දාවූ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකු විසින් හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් පත්කරන ලද ඕනෑම සහතිකලත් ගණන් පරීක්ෂකවරයෙකු විසින් හෝ කළ යුතුය. මේ රීතිවල විධිවිධාන සඳහා සහතික ලත් ගණන් පරීක්ෂකවරයෙකු වනුයේ :–

(අ) වරලත් ගණකාධිකාරීවරයෙකු හෝ වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් හෝ,

(ආ) රෙජිස්ට්‍රාර්තුමා විසින් පවත්වා ගෙන යන ගණන් පරීක්ෂකවරුන්ගේ ලේඛනයට නම ඇතුලත් වී ඇති කෙනෙක් හෝ මණ්ඩලයක් ය.

(ii) සමුපකාර සමිති පනතේ 44(2) වගන්තිය යටතේ විගණනයකට ඇතුළත් වන කාලය සෑමවිටම කලින් පවත්වන ලද විගණනයට ඇතුළත් වූ කාලයේ අවසාන දිනය සිට එවර විගණනය පවත්වන දිනට පූර්වයෙන් අවසන් වූ මුදල් වර්ෂයේ අවසාන දින දක්වා හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් වෙනත් විධානයක් කළහොත් එසේ විධානය කරන දින තෙක් හෝ විය යුතුය.

(iii) අපරාධ නඩුවක් සඳහා යම්කිසි විගණනයක් අවශ්‍ය වූ විට, දොළොස් මසකට අධික නොවන කාලයක් ඇතුළත් වන විශේෂ විගණනයක් සකස් කරන ලෙස ගණන් පරීක්ෂකවරයෙකුට අණ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(iv) ගණන් පරීක්ෂකවරයෙකු රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ආකාරයට ගණන් පරීක්ෂණ වාර්තාවක් පිටපත් දෙකකින් යුක්තව රෙජිස්ට්‍රාර්තුමාට ඉදිරිපත් කළ යුතුය. වෙනත් කරුණු අතරම පහත සඳහන් කරුණු පිළිබඳ ප්‍රකාශනයක් ඒ වාර්තාවට ඇතුළත් කළ යුතුය. එනම් :–

(අ) තමාට අවශ්‍ය සියළුම තොරතුරු හා විස්තර ලබා ගත්තේ ද යන්න,

(ආ) ගිණුම් පොත් සමිතිය විසින් කලට වේලාවට ලියා තිබේ ද යන්න,

(ඇ) ශේෂ පත්‍රය හා ලාභ අලාභ ගිණුම සමිතියේ පොත්පත්වලට අනුකූල ද යන්න.

(v) ගණන් පරීක්ෂක තැන රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරනු ලබන සියළුම උපලේඛන හා සහතිකපත්‍ර තම ගණන් පරීක්ෂණ වාර්තාවට අමුණා එවිය යුතුය.

(vi) ගණන් පරීක්ෂක තැන පහත දැක්වෙන ආකෘතිය අනුව ගණන් පරීක්ෂණ සහතිකයක් සමිතියේ පරීක්ෂිත ශේෂ පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය :-

මම/අපි සීමාසහිත/සීමාරහිත ................................................................ සමුපකාර සමිතියේ/සංගමයේ ගිණුම් පරීක්ෂා කර බලා ඉහත පිටපත් කර තිබෙන ශේෂ පත්‍රයේ ගණන් පරීක්ෂා කළෙමි/කෙළෙමු. මම/අපි (මේ වාර්තාවේ ............... පිටුවේ සඳහන් ඒවා හැර) මට/අපට අවශ්‍ය වූ සියළුම විස්තර හා තොරතුරු සමිතියේ/සංගමයේ නිලධාරීන්ගෙන් ලබා ගත්තෙමි./ගත්තෙමු. මම/අපි ශේෂ පත්‍රයේ සඳහන් සියළුම වත්කම් හා බැරකම් හරි වැරදි බැලුවෙමි./බැලුවෙමු. මේ වත්කම්/බැරකම් තිබෙන බවටත්, ඒවායේ අගය වැඩිකර දක්වා නොමැති බවටත්, මම/අපි සෑහීමකට පත්වීමි/පත්වීමු. මට/අපට වැටහෙන පරිදි ද, සමිතියේ/සංගමයේ පොත්වල දැක්වෙන්නාවූ හා මා වෙත/අප වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු හා විස්තර අනුව ද, ශේෂ පත්‍රය සමිතියේ/සංගමයේ කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා නියම තත්ත්වය විදහාපාන පරිදි සකස් කර තිබෙන බව මාගේ/අපගේ අදහස වේ.

................................ දිනය ........................................ ගණන් පරීක්ෂක තැන.

42. රෙජිස්ට්‍රාර්තුමාට හෝ සමුපකාර සමිති පනතේ 44, 46 හා 47 වගන්ති යටතේ පිළිවෙලින් විගණනය, විභාගය, පරීක්ෂණය හෝ විමර්ෂණය පැවැත්වීමට රෙජිස්ට්‍රාර්තුමාගෙන් බලය ලත් ඕනෑම කෙනෙකුට හෝ අවස්ථාවෝචිත පරිදි, එවැනි විගණනයකට, විභාගයකට, පරීක්ෂණයකට හෝ විමර්ෂණයකට අවශ්‍ය යැයි වැටහෙන ඕනෑම කෙනෙකු කැඳවීමට බලය ඇති වේ. ඒ සඳහා සිතාසි අතින් දිය හැකිය. එසේ නැතහොත් ලියාපදිංචිකළ තැපෑලෙන් යැවිය හැකිය. එහෙත් එසේ කැඳවන ලද ඕනෑම කෙනෙකුට යටත් පිරිසෙයින් සම්පූර්ණ දින 7ක් කල් දිය යුතුය. කැඳවීමට බලය.

43. (i) ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් සමුපකාර සමිති ආඥාපනතේ (107 වෙනි අධිකාරය) 46 වෙනි වගන්තිය යටතේ පනවා, අංක 10086 හා 1950.03.24 දින දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවන ලද සමුපකාර අරමුදල එකී නියෝග මාලාව මේ රීතිවල 55 වෙනි රීතියෙන් පරිච්ඡින්න කරනු ලැබුව ද, එසේම පවතින අතර, ඇමතිතුමාගේ යම්කිසි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, රෙජිස්ට්‍රාර්තුමා විසින් පරිපාලනය කළ යුතුය. ඒ අරමුදලෙහි මුදල් රෙජිස්ට්‍රාර්තුමා විසින් පහත සඳහන් කරුණු සඳහා යෙදිය හැකිය :- සමුපකාර අරමුදල.

(අ) සමුපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ,

(ආ) සමුපකාර සමිතිවල කළමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම,

(ඇ) සමුපකාර සමිතිවලට උපකාර කිරීම.

(ii) සෑම ලියාපදිංචි කළ සමිතියක්ම රෙජිස්ට්‍රාර්තුමා විසින් එසේ නියම කළ විට, එතුමා විසින් නියම කරන පරිදි සමිතියේ වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට දහයකට වැඩි නොවන හා රු. 5කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා ගෙවිය යුතුය.

44. (i) මින් ඉදිරියට අතිරික්ත අරමුදල යයි කියනු ලබන අරමුදලක් සමුපකාර සමිති පනතේ 57(3) වගන්තියේ කටයුතු සඳහා රෙජිස්ට්‍රාර්තුමා විසින් පවත්වාගෙන යා යුතුය. අතිරික්ත අරමුදල.

(ii) මේ රීති ගැසට් පත්‍රයේ පළ කරන දිනට පූර්ව දිනයෙහි භාරකාර අරමුදලෙහි රෙජිස්ට්‍රාර්තුමාට බැරව තිබෙන ශේෂය අතිරික්ත අරමුදලට බැර කළ යුතුය.

(iii) අතිරික්ත අරමුදලට බැරව තිබෙන මුදල් රෙජිස්ට්‍රාර්තුමා විසින් පහත සඳහන් කරුණු සඳහා යෙදිය හැකිය :-

(අ) ඕනෑම ලියාපදිංචි කරන ලද ප්‍රාථමික සමිතියක කොටස් මිළයට ගැනීමෙන් හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කළ හැකි වෙනත් ආකාරයකට හෝ එවැනි සමිතියකට ආධාර කිරීමට ;

(ආ) අතිරික්තයක් ඇතිවී තිබෙන දිස්ත්‍රික්කයේ පිහිටි ඕනෑම ලියාපදිංචි කරන ලද සමිතියකට යම්කිසි ස්ථාවර වත්කම් මිළයට ගැනීමට ආධාර කිරීමට ;

(ඇ) ඇවරකරුවෙකුට විරුද්ධව ඇති සිවිල් නඩුවකදී ඔහුගේ නිදහසට ක්‍රියා කිරීමට ඔහුට ආධාර කිරීමට ;

(ඈ) සමුපකාර සමිති පනතේ 3(1)(ඇ) හා (ඇ) වගන්ති අනුව පිහිටුවන ලද ඕනෑම ලියාපදිංචි කළ සමිතියකට හෝ ලියාපදිංචි කළ සමිතිවලට ආධාර කිරීමේ කටයුත්ත සඳහා පිහිටුවන ලද වෙනත් ආයතනයකට හෝ ආධාර කිරීමට.

සටහන්වල පිටපත්.

45. සමුපකාර සමිති පනතේ 31(1) වගන්තියේ විධිවිධාන සඳහා ලියාපදිංචි කළ සමිතියක පොත්වල යම්කිසි සටහනක පිටපතක් ඒ පිටපත ඒ සටහනේ සත්‍ය පිටපතක් බවටත්, ඒ සටහන ඇතුළත් පොත එවකටත් සමිතිය බාරේ තිබෙන බවටත්, ඒ පිටපතේ පහතින් ලියවිල්ලකින් ප්‍රකාශනයක් කර සහතික කළ හැකිය. එවැනි ප්‍රකාශනයක් සමිතියේ සභාපති හා කාරක සභාවේ වෙනත් සාමාජිකයෙකු ද විසින් අත්සන් කර දිනය සඳහන් කර තිබිය යුතුය.

සංචිතය.

46. ලියාපදිංචි කළ සමිතියක සංචිතය සමුපකාර සමිති පනතේ 42 වගන්තිය අනුව ආයෝජනය කරන ලෙස රෙජිස්ට්‍රාර්තුමා විසින් විශේෂ නියෝගයකින් අණ කළහොත් මිස එකී සමිතියේ කටයුතු සඳහා යෙදිය හැකිය.

47. සංචිතය නොබෙදිය හැකිය. එයින් යම්කිසි කොටසක් ඉල්ලීමට කිසිදු සාමාජිකයෙකුට බලයක් නොමැතිය.

සමිතියේ මුදල් වලින් ඉඩම් ආදිය අත්කර ගැනීම.

48. (i) ලියාපදිංචි කළ සමිතියකට වෙළඳ බඩු තොග හැර රු. 5,000 හෝ ඊට වැඩි වටිනාකමක් ඇති කිසිදු චංචල දේපළක් මහා සභාවේ අනුමැතිය හා රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා නොගෙන අත්කර ගැනීම හෝ විකිණීම හෝ කළ නොහැකිය.

(ii) ලියාපදිංචි කළ සමිතියක් විසින් මහා සභාවේ අනුමැතිය හා රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබාගෙන එහි පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා ඉඩම්, ගොඩනැගිලි හෝ වෙනත් නිශ්චල දේපළ මිළට ගැනීමෙන්, තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීම හා බද්දට ගැනීම හෝ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම කළ හැකිය.

ආරාවුල්.

49. (i) සමුපකාර සමිති පනතේ 58 වෙනි වගන්තිය යටතේ තීරණයක් සඳහා ආරාවුලක් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කිරීමට තිබෙන විට –

(අ) ලියාපදිංචි කළ සමිතියේ කාරක සභාව විසින් ; හෝ

(ආ) ලියාපදිංචි කළ සමිතියේ මහා සභා රැස්වීමකදී සභා සම්මත වූ යෝජනාවක් අනුව ඒ ලියාපදිංචි කළ සමිතිය විසින් ; හෝ

(ඇ) ආරාවුලට සම්බන්ධ එක පාර්ශ්වකරුවකු විසින් ; හෝ

(ඈ) ලියාපදිංචි කළ සමිතියේ කාරක සභිකයෙකුගෙන් හෝ වෙනත් නිලධාරියෙකුගෙන් හෝ අයවිය යුතු මුදලක් සම්බන්ධ ආරාවුලක් නම්, ලියාපදිංචි කළ සමිතියේ ඕනෑම සාමාජිකයෙකු විසින් ; හෝ

එය ඉදිරිපත් කළ හැකිය.

(ii) සමුපකාර සමිති පනතේ 58(1) වෙනි වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කළ හැකි ලියාපදිංචි කළ සමිතියක යම්කිසි ඉල්ලීමක් 49(1) රීතිය යටතේ එසේ කළ හැකි යම් කිසිවකු විසින් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු නොකළහොත් එවැනි ඉල්ලීමකින් ඇතිවන ඕනෑම ආරාවුලක් සමුපකාර සමිති පනතේ 44 වෙනි වගන්තිය යටතේ ඒ සමිතියේ විගණනයක් හෝ 46 වෙනි වගන්තිය යටතේ විභාගයක් හෝ 47 වෙනි වගන්තිය යටතේ පරීක්ෂණයක් හෝ විමර්ශණයක් පවත්වා ඇති ඕනෑම කෙනෙකු විසින් එකී සමිතිය වෙනුවෙන් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කළ හැකිය.

(iii) ආරාවුලක් සමථයකට පත් කිරීමට යා හැකි සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක් හෝ පැමිණිලිකරු වශයෙන් ඉදිරිපත් වන තැනැත්තා විසින් කලින් ගෙවන ලෙස නියම කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(iv) කාරක සභාවේ සාමාජිකයෙකු විසින් හෝ වෙනත් නිලධාරියකු විසින් හෝ ගෙවිය යුතු මුදලක් සම්බන්ධ ආරාවුලක් තීරණය කිරීම සඳහා ලියාපදිංචි කළ සමිතියක ඕනෑම සාමාජිකයෙකු විසින් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කළ විට හෝ යම්කිසි ආරාවුලක් 49(ii) රීතිය යටතේ ඕනෑම කෙනෙකු විසින් රෙජිස්ට්‍රාර්තුමා වෙත යොමු කළ විට හෝ ඒ සාමාජිකයාට හෝ වෙනත් තැනැත්තාට ඒ ආරාවුල පිළිබඳ සියළුම කටයුතුවල දී සමිතිය වෙනුවෙන් ක්‍රියා කිරීමටත්, සමිතියේ ඒ ආරාවුලට අදාළ සියළුම පොත් පත් හා ලියකියවිලි බැලීමටත්, බලය ඇති වේ. තව ද, ඒ සම්බන්ධයෙන් ඔහුට ඇතිවන සාධාරණ වියදම් සමිතියෙන් අයකර ගැනීමට ඔහුට පුළුවන.

ආරාවුලක යම් පාර්ශ්වකරුවකුට හෝ ආරාවුලක පාර්ශ්වකරුවකු වෙනුවෙන් ක්‍රියා කරන කෙනෙකුට හෝ කිසියම් ආකාරයකින් අවහිර කරන කෙනෙක් වරදකට වරදකරුවෙක් වේ.

(v) (අ) යම්කිසි ආරාවුලක් තීරණය කිරීම සඳහා බේරුම්කරුවෙකුට භාර කිරීමට රෙජිස්ට්‍රාර්තුමා තීරණය කළහොත් එවැනි බේරුම්කරුවෙකු රෙජිස්ට්‍රාර්තුමා විසින් පත්කළ යුතුය.

(ආ) 49 (v) (අ) රීතිය යටතේ පත් කරන ලද බේරුම්කරුවෙකු මිය ගියහොත් හෝ බේරුම්කරුවකු වශයෙන් කටයුතු කිරීමට අකමැති වුවහොත් හෝ ඒ කටයුතු පැහැර හැරියොත් හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැනගතහොත් හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ අන් කරුණක් නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ එසේ මියගියා වූ හෝ බේරුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට අකමැති වූ හෝ ක්‍රියා කිරීම පැහැර හැරියා වූ හෝ ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා විසින් දැනගත්තා වූ හෝ පළාතේ නොසිටීම නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූ හෝ ඒ තැනැත්තා වෙනුවට වෙනත් කෙනෙකු පත් කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(ඇ) 49(v)(අ) රීතිය යටතේ රෙජිස්ට්‍රාර්තුමා විසින් පත් කරන ලද බේරුම්කරුවෙකු බේරුම් කිරීම ගැන වහාම ක්‍රියා කර, විභාගය සම්පූර්ණ කර තමා පත්වී තුන් මසක් ඇතුළත තීන්දුව දීම කළ යුතුය. එහෙත් එසේ පත් කරන ලද බේරුම්කරුවකුට ඒ කාලය ඇතුළත විභාගය සම්පූර්ණ කර තීන්දුව දීම කළ නොහැකි වේ නම්, ඒ නියමිත තුන් මාසය ඇතුළත තීන්දුව දීමට නොහැකි හේතු දක්වමින් ඒ බව රෙජිස්ට්‍රාර්තුමාට වහාම දන්වා සිටිය යුතුය. තවද, විභාග කර, තීන්දුව දීම සම්පූර්ණ කිරීමට අවශ්‍ය යයි තමාට වැටහෙන කාලය ද එහි දැක්විය යුතුය. එවිට ඒ කාලය තමාට වැටහෙන ප්‍රමාණයකින් දීර්ඝ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට පුළුවන.

(ඈ) බේරුම්කරුවෙකුට ඉහත සඳහන් යම්කිසි කරුණක් නිසා ඒ බේරුම් කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කළ නොහැකි විට, තමා වෙත යොමු කරන ලද ඒ සියළුම ලියකියවිලි රෙජිස්ට්‍රාර්තුමා වෙත වහාම ආපසු යැවිය යුතුය.

(ඉ) ආරාවුලේ එක පාර්ශ්වකරුවකු නොපැමිණීම නිසා බේරුම්කරුවෙකු විසින් ඉල්ලීමක් නිශ්ප්‍රභා නොකළ යුතු වේ. යථා පරිදි කැඳවූ විටත් ආරාවුලක විත්තිකරුවෙකු නොපැමිණියොත් ඒ ආරාවුල ඒකපාර්ශිකව තීරණය කර තීන්දුවක් දීමට බේරුම්කරු විසින් ක්‍රියා කළ යුතුය. එහෙත් ආරවුලක් පළමුවෙනි දිනම ඒකපාර්ශ්විකව තීරණය නොකළ යුතුය.

(vi) යම්කිසි ආරාවුලක් බේරුම්කරුවන් එක් කෙනෙකුට වැඩි ගණනකට භාර කිරීමට රෙජිස්ට්‍රාර්තුමා විසින් තීරණය කළහොත් බේරුම්කරුවන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් ඔහු විසින් පත් කළ යුතුය. ඒ මණ්ඩලයට ආරාවුලේ එක් එක් පාර්ශ්වකරුවකු විසින් එක් එක්කෙනා බැගින් නම් කළ යුතු අතර, තුන්වෙනි බේරුම්කරු රෙජිස්ට්‍රාර්තුමා විසින් නම් කළ යුතුය. රෙජිස්ට්‍රාර්තුමා විසින් නම් කළ අය මණ්ඩලයේ සභාපති වශයෙන් ක්‍රියාකළ යුතුය.

(vii) (අ) ආරාවුලක යම්කිසි පාර්ශ්වකරුවකුට 49(vi) රීතිය යටතේ බේරුම්කරුවෙකු නම් කරන ලෙස රෙජිස්ට්‍රාර්තුමා විසින් දන්වා සිටිය විට දින 15ක් ඇතුළත එසේ නොකළහොත් ඒ වෙනුවට කෙනෙකු නම් කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට පුළුවන.

(ආ) ආරාවුලක යම් පාර්ශ්වකරුවකු විසින් නම් කරන ලද බේරුම්කරුවෙකු මියගියහොත් හෝ බේරුම්කරුවෙකු වශයෙන් කටයුතු කිරීමට අකමැති වුවහොත් හෝ ඒ කටයුතු පැහැර හැරියොත් හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැනගතහොත් හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ අන් කරුණක් නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ එසේ මියගියා වූ හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අකමැති වූ හෝ ක්‍රියා කිරීම පැහැර හැරියා වූ හෝ ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා විසින් දැනගත්තා වූ හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ වෙනත් කරුණක් නිසා බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූ හෝ ඒ තැනැත්තා වෙනුවට වෙනත් බේරුම්කරුවෙකු නම් කරන ලෙස ඒ පාර්ශ්වකරුට දන්වා සිටීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇති වේ. ඒ පාර්ශ්වකරු දින 15ක් ඇතුළත එසේ නොකළහොත් රෙජිස්ට්‍රාර්තුමා විසින් බේරුම්කරුවෙකු නම් කළ හැකිය.

(ඇ) රෙජිස්ට්‍රාර්තුමා විසින් බේරුම්කරුවෙකු වශයෙන් නම් කරන ලද කෙනෙකු මියගියහොත් හෝ බේරුම්කරුවෙකු වශයෙන් කටයුතු කිරීමට අකමැති වුවහොත් හෝ ඒ කටයුතු පැහැර හැරියොත් හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා දැනගතහොත් හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ අන් කරුණක් නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ එසේ මිය ගියා වූ හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අකමැති වූ හෝ ක්‍රියා කිරීම පැහැර හැරියා වූ හෝ ක්‍රියා කිරීමට නුසුදුසු බව රෙජිස්ට්‍රාර්තුමා විසින් දැනගත්තා වූ හෝ පළාතේ නොසිටීම නිසා හෝ අසනීපයක් නිසා හෝ වෙනත් කරුණක් නිසා හෝ බේරුම්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වූ හෝ ඒ තැනැත්තා වෙනුවට වෙනත් කෙනෙකු නම් කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(viii) ආරාවුලක කිසිම පාර්ශ්වකරුවෙකුට නීතිඥයෙකු බේරුම්කරුවෙකු වශයෙන් නම් කළ නොහැකිය.

(ix) මේ රීතිය යටතේ සියළුම ක්‍රියාවල දී රෙජිස්ට්‍රාර්තුමාට හෝ බේරුම්කරුට හෝ බේරුම්කරුවන්ට හෝ පහත සඳහන් බලතල ඇති වේ :-

(අ) දිවුරවීම ;

(ආ) වාචිකව හෝ අතින් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ සමිතියේ කටයුතු කරන ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති ළඟම තිබෙන සිවිල් උසාවිය මගින් හෝ සිතාසි යවා ආරාවුලේ පාර්ශ්වකරුවන් හා සාක්ෂිකරුවන් කැඳවීම හා අවශ්‍ය සියළුම පොත්පත් හා ලියකියවිලි ඉදිරිපත් කරවීම ;

(ඇ) 49(i) (ඇ) හෝ 49(ii) රීතිය යටතේ තීරණය කිරීම සඳහා ආරාවුලක් යොමු කරන පාර්ශ්වකරුගේ හෝ තැනැත්තාගේ හෝ වියදම් ඇතුළුව ආරාවුල තීරණය කිරීමට ගිය වියදම් සමිතියේ මුදල්වලින් හෝ සුදුසු යයි තමාට වැටහෙන යම්කිසි පාර්ශ්වකරුවකු හෝ පාර්ශ්වකරුවන් හෝ විසින් ගෙවන ලෙස නියෝග කිරීම.

(x) රෙජිස්ට්‍රාර්තුමා හෝ බේරුම්කරු හෝ බේරුම්කරුවන් හෝ ආරාවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ ද, ඔවුන්ගේ සාක්ෂිකරුවන්ගේ ද, සාක්ෂි අසා, ඒ අනුව ද කිසිම පාර්ශ්වකරුවකු විසින් ලියකියවිලි වලින් ඉදිරිපත් කරන සාක්ෂි වෙතොත් ඒවා ද සැළකිල්ලට ගෙන, අවස්ථාවෝචිත පරිදි, තීරණය හෝ තීන්දුව හෝ යුක්තිය, සාධාරණත්වය හා හෘදය සාක්ෂිය අනුව දිය යුතුය.

බේරුම්කරුගේ හෝ බේරුම්කරුවන්ගේ හෝ තීන්දුව ලියා පාර්ශ්වකරුවන්ට කියවා රෙජිස්ට්‍රාර්තුමා හෝ එතුමා විසින් නියම කළ හැකි එතුමා යටතේ ක්‍රියා කරන නිලධාරියෙකුගේ හෝ කාර්යාලයට විභාග වාර්තාවක් සමඟ යැවිය යුතුය.

(xi) බේරුම්කරුවන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් වෙත ඉදිරිපත් වන කරුණක් තීරණය කළ යුත්තේ වැඩිදෙනාගේ අදහස අනුවය. එක එක බේරුම්කරුගේ අදහස් වෙනස් වූ විට, මණ්ඩලයේ සභාපතිතැනගේ අදහස පරිදි තීරණය කළ යුතුය.

(xii) (අ) බේරුම්කරුවෙකුගේ හෝ බේරුම්කරුවන්ගේ හෝ තීන්දුවකට විරුද්ධව රෙජිස්ට්‍රාර්තුමාට කරන ඕනෑම ආයාචනයක් ඊට හේතු ලියවිල්ලකින් දක්වමින් තීන්දුව දෙන ලද දින සිට දින 30ක් ඇතුළත කළ යුතුය. තවද තීන්දුව දෙන ලද්දේ යම්කිසි පාර්ශ්වකරුවකුට විරුද්ධව ද, ඒ පාර්ශ්වකරු විසින් ආයාචනයක් කරන කළ රු. 50ක් ද, ඒ තීන්දු කරන ලද මුදලෙන් 10%ක් ද, යන ප්‍රමාණ දෙකෙන් වැඩි ප්‍රමාණය ආයාචනය සඳහා තැන්පත් මුදලක් වශයෙන් ආයාචනය සමඟ යැවිය යුතුය. ආයාචනය කරන්නේ මුදලක් ඉල්ලා සිටින පාර්ශ්වකරුවකු විසින් නම්, රු. 50ක් ද, ඒ ඉල්ලා සිටින මුදලෙන් 10%ක් ද, යන ප්‍රමාණ දෙකෙන් වැඩි ප්‍රමාණය ආයාචනය සඳහා තැන්පත් මුදලක් වශයෙන් ආයාචනය සමඟ යැවිය යුතුය.

(ආ) ඉහත සඳහන් කරුණුවලට අනුකූලව නොකරන ආයාචනයක් රෙජිස්ට්‍රාර්තුමා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

(ඇ) ආරාවුලට සම්බන්ධ කිසිම පාර්ශ්වකරුවකුගෙන් කරුණු නොඅසා ආයාචනයක් තීරණය කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ.

(ඈ) ආයාචනයක් ඉදිරිපත් කිරීමට සාධාරණ කරුණු තිබේ යයි රෙජිස්ට්‍රාර්තුමා විසින් සෑහීමකට පත්වූ විට, ආයාචනය ඉදිරිපත් කරන තැනැත්තා විසින් තැන්පත් කරන ලද මුදල ඔහුට ආපසු දිය හැකිය.

(ඉ) ආයාචනයක් ඉදිරිපත් කිරීමට සාධාරණ කරුණු නොමැති යයි රෙජිස්ට්‍රාර්තුමා සෑහීමකට පත් වූ විට ආයාචනය සඳහා කරන ලද තැන්පත් මුදල රාජසන්තක කර, ඒකාබද්ධ අරමුදලට බැර කළ හැකිය.

(xiii) රෙජිස්ට්‍රාර්තුමා හෝ බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් හෝ ඉදිරියේ දී කිසිම පාර්ශ්වකරුවකු වෙනුවෙන් නීතිඥයෙකුට පෙනී සිටීමට නුපුළුවන.

ඇමතිතුමාට කරන ආයාචනා.

50. සමුපකාර සමිති පනතේ 44 වෙනි හෝ 49 වෙනි වගන්ති යටතේ කරන ආයාචනයක් සම්බන්ධයෙන් ඇමතිතුමාගේ නියෝගය අවසාන තීරණය වේ.

51. (i) ලියාපදිංචි කළ සමිතියක ඕනෑම කාරක සභිකයෙකු හෝ වෙනත් නිලධාරියෙකු හෝ සේවකයෙකු හෝ, අවශ්‍යයයි තමාට වැටහෙන යම්කිසි විභාගයකින් පසු, ඔහුගේ රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස කරගෙන යාමට නුසුදුසු යයි හෝ වෙනත් කරුණක් නිසා ඔහුට ඔහුගේ රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස කළ නොහැකි යයි හෝ රෙජිස්ට්‍රාර්තුමාට වැටහුණහොත් ඒ කාරක සභිකයා හෝ නිලධාරියා හෝ සේවකයා හෝ යම්කිසි නියමිත දිනකට පෙර ඉවත් කරන ලෙස ලියවිල්ලකින් වූ නියෝගයකින් අණ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ. එවිට රෙජිස්ට්‍රාර්තුමාගේ ඒ විධානය අනුව සමිතිය විසින් ක්‍රියා කළ යුතුය. නුසුදුසු නිලධාරීන් හෝ කාරක සභා.

(ii) ලියාපදිංචි කළ සමිතියක් 51(i) රීතිය යටතේ නියෝගයක් අනුව ක්‍රියා නොකළහොත්, අවස්ථාවෝචිත පරිදි, කාරක සභිකයා හෝ නිලධාරියා හෝ සේවකයා හෝ යම්කිසි නියමිත දිනකට පෙර තම නිලයෙන් ඉල්ලා අස්වන ලෙස ලියවිල්ලකින් වූ නියෝගයකින් අණ කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ. එවිට ඒ කාරක සභිකයාගේ හෝ නිලධාරියාගේ හෝ සේවකයාගේ හෝ නිලය ඒ නියමිත දින සිට ඔහුට අහිමි වන අතර, සමිතිය විසින් ඔහු වෙත පවරන ලද හෝ භාර කරන ලද හෝ බලතල හා යුතුකම් ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ බලය ඔහුට අහිමි වේ.

මේ රීතිය යටතේ කාරක සභිකයෙකුට හෝ වෙනත් නිලධාරියෙකුට හෝ සේවකයෙකුට හෝ තම නිලය අහිමි වූ විට, තමා භාරයේ තිබෙන සමිතියේ සියළුම පොත්පත්, ලියකියවිලි හා වෙනත් වත්කම් නියමිත දිනට පෙර, සමිතියේ වගකිවයුතු නිලධාරියෙකුට භාරකර, ලදුපතක් ලබාගත යුතුය. ඉහත සඳහන් කරුණු අනුව ක්‍රියා නොකිරීම වරදක් වේ.

52. සමුපකාර සමිති පනතේ 48 වෙනි වගන්තිය යටතේ යම් කිසිවකු හෝ යම්කිසි අය හෝ ලියාපදිංචි කරන ලද සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා පත් කළ විට විසුරුවා හරින ලද කාරක සභාවේ සභිකයින් ඒ තැනැත්තාට හෝ ඒ අයට හෝ සමිතියේ සම්පූර්ණ ව්‍යාපාරික කටයුතු ද සමිතියේ පොත්පත් හා ලියකියවිලි ඇතුළු වෙනත් සියළුම දේපළ ද රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කළ හැකි කාලයක් ඇතුළත භාරදිය යුතුය. කාරක සභාව විසින් සමිතියේ සම්පූර්ණ ව්‍යාපාරික කටයුතු ද පොත්පත් හා ලියකියවිලි ඇතුළු වෙනත් සියළුම දේපළ ද රෙජිස්ට්‍රාර්තුමා විසින් පත් කරන ලද තැනැත්තාට හෝ අයට හෝ භාර නුදුන්නොත් ඒ එක එක කාරක සභිකයා වරදකට වරදකරුවෙක් වේ.

53. ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයින් නොවන්නන් සමග කරන යම්කිසි ගණුදෙනු සමුපකාර ප්‍රතිපත්තිවලට පටහැනි යයි හෝ එවැන්නකින් ලියාපදිංචි කළ සමිතිවලට හිමිවන වරප්‍රසාදයක් අනිසි ලෙස යෙදවීමක් හෝ ආදායම් බදු ගෙවීම මගහැරීමක් හෝ රජයේ යම්කිසි නියෝග හෝ රීති හෝ කඩකිරීමක් හෝ සිදුවේ යයි රෙජිස්ට්‍රාර්තුමාට වැටහුණහොත් එවැනි ගණුදෙනු තහනම් කිරීමට හෝ සීමා කිරීමට හෝ රෙජිස්ට්‍රාර්තුමාට බලය තිබේ. සාමාජිකයින් නොවන අය සමග ගණුදෙනු.

54. මේ රීති යටතේ කෙරෙන සියළුම වැරදි සම්බන්ධයෙන් සමුපකාර සමිති පනතේ 72 වගන්තිය යටතේ කෙරෙන වැරදි හා සමානව ක්‍රියා කළ යුතුය. වැරදි.

55. අංක 10086 හා 1950 මාර්තු 24 දින දරන ගැසට් පත්‍රයේ ද අංක 11,423 හා 1958 ජූලි 11 දින දරන ගැසට් පත්‍රයේ ද, ප්‍රකාශිත රීති මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ. පරිච්ඡින්න කිරීම.

## උපලේඛනය

### *ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රයේ ආකෘතිය (4 වෙනි රීතිය)*

.................................................................................................... සමිතිය
....................................................................................යන ලිපිනය හා ඉහත සඳහන්
නාමය දරන ..............................................................................................
....................................................... වගකීමක් ඇති සමුපකාර සමිතියක් ලෙස 1972 අංක 05
දරන සමුපකාර සමිති පනතේ 6 වෙනි වගන්තිය යටතේ අද දින ලියාපදිංචි කළ බව මෙයින් සහතික කරමි.

........ ..........................................
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්/උප රෙජිස්ට්‍රාර්.

දිනය :.................

03–00

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.